රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி:**(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்:**(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** / Web Site

---

මගේ අංකය / எனது இல / My No: COMS/Trans-BR/OS

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2020.05.06

ඒකාබද්ධ සේවයේ සියළු නිලධාරීන්

**ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ විස්තර මාර්ගගත ක්‍රමයට(Online) දත්ත පද්ධතියට ඇතුලත් කිරීම**

කළමනාකරණ සේවා නිලධාරී සේවය , ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය හා සංවර්ධන නිලධාරී සේවය යන සේවාවන්ට අයත් නිලධාරීන් සඳහා සාර්ථකව අත්හදා බලා ඇති මාර්ගගත දත්ත පද්ධතිය(Online System) ඒකාබද්ධ සේවයේ අනෙකුත් සේවාවන් සඳහාද යොදා ගැනීමට තීරණය කර ඇත.

02. ඒ අනුව ඔබ සංවර්ධන නිලධාරී සේවයේ නිලධරයෙකු නම් http://203.94.94.214/miscod ඔස්සේද, රජයේ භාෂා පරිවර්තක සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය, කළමනාකරණ සේවා නිලධාරී සේවය, ඒකාබද්ධ රියදුරු සේවය හා කාර්යාල සේවක සේවය යන සේවාවලින් එක් සේවාවකට අයත් වන නිලධරයෙක් නම් http://203.94.94.214/misco ඔස්සේද දත්ත පද්ධතියට පිවිසිය හැක. අතුරු මුහුණතේ ඇති Help සබැඳිය ඔස්සේ ගොස් පරිශීලක අත්පොත (User Guide) පරිශීලනය කිරීමෙන් දත්ත පද්ධතිය සම්බන්ධව විස්තර ලබා ගත හැක.

03.තවද ඔබ හට සේවාශ්‍රිත යම් ගැටළුවක් පවතී නම් http://203.94.94.214/csinq ඔස්සේ ඔබගේ විමසීම් අප වෙත ඉදිරිපත් කල හැකි අතර වැඩිදුර තොරතුරු විමසීම් පද්ධතිය තුල ඇති පරිශීලක අත්පොතෙහි(User Guide) සඳහන් වේ.

04.නිලධාරීන්ගේ තොරතුරු, දත්ත පද්ධතියට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් හෝ පද්ධතිය සම්බන්ධව තාක්ෂණික ගැටළු පවතීනම් ඉහත විමසීම් පද්ධතිය( http://203.94.94.214/csinq) ඔස්සේ ගොස් ඉහල ඇති Add Inquiry සබැඳිය තෝරා Category හි System Related Matters ද Section හි PMO-TRANS යන්නද තෝරා ගෙන Descriptions හි තම ගැටළුව ඉදිරිපත් කල හැක.

05. දත්ත ඇතුලත් කල යුතු අවසාන දිනය 2020/06/30 වේ.

06. කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සමග සමාජ දුරස්ථභාවය හා සෞඛ්‍යාරක්ෂිතභාවය රැකෙන පරිදි ඒකාබද්ධ සේවා අංශය විසින් ඔබ සඳහා ලබා දෙන සේවාවන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා ගනු ලබන මෙම ක්‍රියාමාර්ග සඳහා ඔබගේ කාරුණික සහයෝගය අපේක්ෂා කරමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්